
# ඉන්දියන් සාගරයේ මුතු ඇටය හැඩවූ දිවිවා



හරිනි ගීත්මා හිංගලගොඩ

# ඉන්දියන් සාගරයේ මුතු ඇටය හැඩවූ දිවයින

හරිනි ගීත්මා හිංගලගොඩ

# ඉන්දියන් සාගරයේ මුතු ඇටය හැඬවූ දිට්වා

කතෘ ප්‍රකාශනයකි

පළවන මුද්‍රණය 2026 .......

කතාව සහ චිත්‍ර

**හරිනි ගීත්මා හිංගලගොඩ**

7 ශ්‍රේණිය C

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

ISBN 978-624-211-050-9

# පිදුම

මාගේ දයාබර

දෙමව්පියන්ට

හා මහාමායා

විදු මව්ගේ

ආදර ගුරු මෑණිවරුන් ට

හා ගුරු පියවරුන්ට

මේ පොත

බැති සිතින්

පිළිගන්වමි



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධණය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

"**දිට්වා**" යනු යේමනයේ ඇති ලස්සන කලපුවක නමක් ය. එහෙත් දිට්වා ශ්‍රී ලංකාවට සිදු කලේ විශාල විපතක් බව ඔබ සියලු දෙනාම දන්නවා නේද? දිට්වා සුළි කුණාටුව ශ්‍රී ලංකාවට පැමිණි යේ 2025 වර්ෂයේ නොවැම්බර් මස 27 වන දිනයේ උදෑසනයි. ඒ පැමිණියේ ශ්‍රී ලංකාවට බොහො විපත් උරුම කර දීමේ බලාපොරොත්තු වෙනි.

ශ්‍රී ලංකාවට බලපාන සුළි කුණාටු ඇති වන්නේ කෙසේ ද? දිවයිනට බලපාන සුළි කුණාටු ඇති වන්නේ බෙංගාල බොක්ක ආශ්‍රිතවයි. ප්‍රථමයෙන්ම එම ප්‍රදේශය ආශ්‍රිතව අඩු පීඩන කලාපයක් ඇතිවෙයි. දෙවනුව එය පීඩන අවපාතයක් දක්වා ක්‍රමක් ක්‍රමයෙන් වර්ධනය වෙයි. ඒ ආකාරයට ශ්‍රී ලංකාවට බලපාන සියලුම සුළි කුණාටු ඇති වන්නේ එම ආකාරයට බව ඔබ සැවොම දැන් දනී.




මෙම සුළි කුණාටුවේ දී හා අනෙකුත් සුළි කුණාටු වලදී අනෝරා වැසි ඇද හැලෙන බවත්, අධික සුළං ඇති වන බව ඔබ දනී. මෙම සුළි කුණාටුව දිස්ත්‍රික්ක 22 කට බලපෑහ. මෙම සුළි කුණාටුවෙන් බලපෑමක් නොවූ දිස්ත්‍රික්ක වන්නේ ගාල්ල, මාතර හා හම්බන්තොට යන දකුණු පළාතේ පිහිටි දිස්ත්‍රික්කවලටයි. අනෙක් පළාත් වල පිහිටි දිස්ත්‍රික්කවලට විශාල වශයෙන් නායයාම් හා ගංවතුර ආදී ස්වභාවික ආපදාවලින් එහි ජීවත් වූ ජනතාවට බාධා එල්ල වුණි.

වැඩිම හානියක් සිදු කලේ මහනුවර දිස්ත්‍රික්කයටයි. මහනුවරින් මරණ 234 ක් ද, අතුරුදහන් වූ පිරිස 81 ක් ද සිටියි. මේ මියගිය පුද්ගලයින් හා අතුරුදහන් වූ පුද්ගලයින් අතර ගුරුවරු 10 ක් ද ළමුන් 35 දෙනෙකු ද අතුරුදහන් හා මිය ගොස් ය.

දෙස් විදෙස් සංචාරකයන්ගේ සිත් දිනාගත් ස්ථානයක් වන පේරාදෙණිය උද්භිද උද්‍යානයට ද මෙයින් හානි සිදු විය. එම උද්‍යානයේ අක්කර 80 ක් ගංවතුරෙන් විනාශ විය. එම උද්‍යානයේ තිබූ මව් ශාක හා වෙනත් ශාක වර්ග 100 කට අධික ප්‍රමාණයක් විනාශ වුණි. එමෙන් ම පේරාදෙණිය කළු පාලම හා පේරාදෙණිය විශ්ව විද්‍යාලය හා නුවර උසාවිය වැනි ස්ථානවලට හානි සිදුවිය.

# මහනුවර



මීට අමතරව නායයාම් හා කඳු කඩා වැටීම් නිසා නිවාස හා දේපල හානි සහ ගොවි බිම් බොහෝමයකට හානි වූ අතර ගම් විශාල ප්‍රමාණයක් නායයාම් වලට ගොදුරු විය.

බදුල්ල දිස්ත්‍රික්කයට දෙවනුවට වැඩිම බලපෑම් සිදුවිය. මෙම ප්‍රදේශයේ වැඩි වශයෙන් සිදු වූයේ නායයාම් වලින් බලපෑම් ය. එහෙත් බදුල්ල දිස්ත්‍රික්කයේ විවිධ ප්‍රදේශවලට ගංවතුරෙන් ද පීඩා එල්ල වුණි. මෙම දිස්ත්‍රික්කයේ මරණ 90 ක් පමණ තිබේ. ඒ අතර තවත් බොහෝ පිරිසක් අතුරුදහන් විය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් නායයාම් සිදු වූ අතර නුවරඑළියේ පිහිටි රම්බඩගම වැනි ප්‍රදේශවල විශාල වශයෙන් නායයාම් සිදුවිය. එහි මරණ 89 ක් වාර්තා වූ අතර තවත් පිරිසක් අතුරුදහන් විය. නුවරඑළිය තෙවනුව වැඩිම බලපෑම් සිදු වූ ප්‍රදේශයයි.

කොළඹ දිස්ත්‍රික්කයට ගංවතුර හා නාය යෑමෙන් විශාල බලපෑමක් කොළඹ දිස්ත්‍රික්කයට ඇතිවිය. කැළණි ගඟ පිටාර ගැලීම හේතුවෙන් කොළඹ නගරයේ කොටසක් ම යට විය. නායයාම් ද විටින් විට වාර්තා විය. කොළඹ නගරයේ දැනට මරණ 9 ක් වාර්තා විය. තවත් බොහෝ පිරිස් අතුරුදහන් විය.

මාතලේ දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ ගංවතුරෙන් යට විය. එමෙන් ම මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි සිත් ගන්නා සුළු කඳු වැටියක් වන රිවස්ටන් කඳු වැටිය ද නායයාම් වලට ගොදුරු විය. මෙහි දී මරණ 28 ක් දක්වා වර්ධනය වූ අතර තවත් බොහෝ පිරිසක් අතුරුදහන් විය.

කෑගල්ල දිස්ත්‍රික්කයට දැඩි වර්ෂාවක් ඇද හැලුනි. මෙම නිසා විශාල වශයෙන් සිදු වූයේ නායයාම් ය. මෙහිදී දේපල බොහොමයක් ම විනාශයට පත්විය. දැනට මරණ 9 ක් ද වාර්තා වුණි. තවත් බොහෝ පිරිසක් නායයාම් වලින් හා ගංවතුර හේතුවෙන් අතරුදහන් විය.

අම්පාර දිස්ත්‍රික්කයට ද විශාල වශයෙන් නායයාම් හා ගංවතුරින් මෙම දිස්ත්‍රක්කයේ ජීවත් වන බොහෝ පිරිසකට බලපෑම් එල්ල විය. මෙයින් දේපල හානි හා ජීවිත හානි බොහොමයක් සිදු විය.

මෙයින් සංචාරක කර්මාන්ත හා ධීවර කර්මාන්ත බොහොමයක් බලපෑමට ලක්විය. මෙහි දී වැඩි මරණ හා දේපල හානි වී ඇත්තේ නායාම් වලින් බව මා හට කිව හැක. දැනට මරණ 8 ක් සිදු විය. තවත් බොහෝ පිරිසක් අතුරුදහන් විය.

මඩකලපුව දිස්ත්‍රික්කයේ ගංවතුරින් අලාභ හානි සිදු වූ අතර මෙහි දී ගොඩනැගිලි වගා බිම් හා මාර්ග සියල්ලම ජලයෙන් යට වී විනාශ විය. නායාම් බොහොමයක් සිදු වූ අතර මරණ හා අතුරුදන් වීම් බොහොමයක් සිදු විය.

ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක හා මෙහි සඳහන් වූ දිස්ත්‍රික්ක හැර තවත් දිස්ත්‍රික්ක 13 කට මේ විනාශයෙන් බලපෑම් එල්ල වුණි.

මෙම වියසනයෙන් 639 කට වැඩි පිරිසක් මියගිය අතර 100 කට අධික පිරිසක් අතුරුදන් විය. මෙයින් මිලියනයකට අධික පිරිසකට බලපෑම් එල්ල විය.

වැඩි සංඛ්‍යාවක් මරණ කඳුකර ප්‍රදේශ වලින් වාර්තා වුණි. (මහනුවර, බදුල්ල සහ නුවරඑළිය වැනි ප්‍රදේශ)

සමස්ථ වශයෙන් නිවාස 5000 කට අධික ප්‍රමාණයක් සම්පූර්ණයෙන් ම විනාශ වූ අතර එයින් නිවාස 86000 කට අර්ධ හානි සිදු විය.

මෙයින් බොහෝ ප්‍රදේශ වල විදුලි සැපයුම් හා ජල සැපයුම් ලබා දෙන ස්ථානවලට හානි සිදුවී තිබිණි.

මෙයින් සමස්ථ වශයෙන් ගතහොත් ශ්‍රී ලංකාව 20% ක් ජලයෙන් යට විය. 16000 km මාර්ග වලට හානි සිදු විය. ගමනා ගමනයට ද බාධා ඇති විය. දුම්රිය මාර්ග 278 km ක් ද පාලම් 40 කට වැඩි ප්‍රමාණයක් විනාශ විය.

මෙම විපත ස්වාභාවික විපතක් වුව ද මෙතරම් හානියක් සිදු වූයේ මිනිසාගේ අයහපත් ක්‍රියාකාරකම් හේතුවෙනි. එම මිනිසා සෑම විට ම ස්වභාවධර්මයට ගරු කළ යුතු අතර එවිට ස්වභාවධර්මය ද අප හට හොඳින් සලකයි. පරිසරය රැක ගැනීම මිනිසාගේ යුතු කමකි.

නිමි

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධණය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා සංවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)